**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි**
**පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම - 2022**
**දෙවන අදියර**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මඟින් පවත්වනු ලබන සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීමට තෝරා ගැනීම පිණිස සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2023.02.06 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පාඨමාලාවට අදාළ තොරතුරු external.sjp.ac.lk යන වෙබ් අඩවියෙහි සඳහන් වේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය**

1. අයදුම්පත් යොමු කළ හැක්කේ මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණි. ඒ අනුව external.sjp.ac.lk වෙබ් අඩවියට පිවිස නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ (Submit) යුතුය.

2. අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත කළ යුතුය.

   i. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්.
   ii. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්.
   iii. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්.
   iv. බැංකුවට මුදල් ගෙවන ලද රිසිට්පතේ මුල් පිටපත.

3. ඉහත 2 හි සඳහන් ලේඛනවල පිටපත් සමඟ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි පිටපතක් (Hard copy) පහත සඳහන් ලිපිනයට 2023.02.06 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

   (සැ. යු. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කර එවිය යුතුය)

4. මෙම උපාධි පාඨමාලාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ, ගංගොඩවිල, මහජන බැංකු ශාඛාවේ පහතින් දක්වා ඇති ගිණුම් අංකයට බැර වන පරිදි දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට රු. 3000/- මුදලක් (ආපසු නොගෙවන) ගෙවා ලබා ගත් රිසිට් පතෙහි මුල් පිටපත අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් ගිණුම් අංකයට පමණක් මුදල් ගෙවීම අනිවාර්ය වේ (බැංකු රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතු වේ).

| **උපාධි පාඨමාලාව** | **ගිණුම් අංකය** |
|---|---|
| සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **072010007069** |

5. බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය විසින් බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීමේ අදියර 01 යටතේ (2022 ඔක්තෝබර් මස 30 දක්වා) අයදුම්පත් කැඳවීමේදී ඉහත පාඨමාලාව හැර වෙනත් බාහිර උපාධි පාඨමාලා සඳහා අයදුම්කර මෙතෙක් ලියාපදිංචි ගාස්තු ගෙවීමට නොහැකිව ලියාපදිංචිවීමේ අවස්ථාව නොලද යම් අපේක්ෂකයෙකු වේ නම් ඉහත සඳහන් රු.3000 ක මුදල ගෙවීමකින් තොරව නැවත සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට අයදුම් කළ හැකිය. (අයදුම්පත සමඟ මුදල් ගෙවූ රිසිට් පතෙහි පිටපතක් එවිය යුතුය.)

**අයදුම්කරුවන් සඳහා උපදෙස් ඃ**

- **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට අනුබද්ධ කිසිදු නියෝජිත ආයතනයක් නොමැත. එබැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස උක්ත සඳහන් ක්‍රමවේදය පමණක් අනුගමනය කළ යුතුය. වෙනත් නියෝජිතායතන හරහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.**
- **ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය ඃ**

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
තැ. පෙ. අංක 10
ගංගොඩවිල
නුගේගොඩ

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2023-01-26